සබරගමුව පළාත් සභාව - 2019
-----------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන
-----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

සබරගමුව පළාත් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2020 නොවැම්බර් 30 දින නිකුත් කරන ලද අතර, ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 නොවැම්බර් 30 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට සබරගමුව පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-------------------------------------------

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ------------- | ---------------------------- |
| (අ) | පළාත් සභාව විසින් 2015 වර්ෂයේ දී මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ මිලදී ගෙන තිබූ වාහන 49 ක වටිනාකම වූ රු.150,990,000 ක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණි. | සියළුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතු ය. | ඉදිරි වර්ෂයේ දි කල්බදු වාහන ගිණුම් ගත කරමි. |
| (ආ) | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් යටතේ ස්ථාවර වත්කම් හා කෙරීගෙන යන වැඩ වශයෙන් රු.4,376,709,786 ක් දක්වා තිබුණ ද පළාත් භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව එය රු.4,571,189,384 ක් වුයෙන් රු.194,479,598 ක ශුද්ධ වෙනසක් නිරීක්ෂණය විය. තවද, පළාත් සභාවේ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු 15 ක් විසින් 2018 ජනවාරි 01 දිනට පැවති ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීම අවසන් කර නොතිබුණු අතර, මූල්‍ය ප්‍රකාශනවල ඒ පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සහ භාණ්ඩාගාර මුද්‍රිත අතර වෙනස්කම් සැසඳිය යුතු අතර, සියළු ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීම අවසන් කළ යුතු ය. | ඉදිරි වර්ෂය තුළ දි නොසැසඳීම් නිරවුල් කිරීමට කටයුතු කරමි. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමණාකාරිත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සබරගමුව පළාත් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

**--------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේ දී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතු ය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්ව ඇත.

(අ) 6 (i) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 6(i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 අනුකූල නොවීම්**

---

**නීති රීති , රෙගුලාසි හා කළමණාකරන තීරණවලට අනුකූල නොවීම**

---

| | නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (8) හා (9) වගන්ති | මවිසින් 2006 අගෝස්තු 11 සහ 2019 අප්‍රේල් 12 දිනයන්හි දී නිකුත් කළ අධිභාර සහතික 02 කට අදාලව රු.733,830 ක් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | වාරික වශයෙන් අයකරගැනීමට හා නඩු පැවරීමට කටයුතු කර ඇත. |
| (ආ) | 1993 අංක 05 දරන සබරගමුව පළාතේ නිවාස සංවර්ධන අරමුදල පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තියේ 07 වගන්තිය | අරමුදලේ පරමාර්ථ ඉටුකර ගැනීම පිණිස අරමුදල් යෙදවීමේ ක්‍රම පිළිබඳව රෙගුලාසි සකස්කර නොතිබුණි. | ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කළයුතුය. | ඉදිරියේ දී රෙගුලාසි සකස් කර පළාත් සභාවේ අනුමැතිය ලබාගනිමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ XV වැනි පරිච්ඡේදයේ 4.2 , 4.4 හා 5.2 වගන්ති | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුරක සේවයේ නියුතුව සිටි නිලධාරිනියකගේ සම්පූර්ණ වැටුප් සහිත විදේශ අධ්‍යයන නිවාඩු අනුමත කිරීමේ දී බැඳුම්කරයක් ලියා අත්සන් කරගෙන නොතිබු අතර, වැටුප් සහිත අධ්‍යයන නිවාඩු කාලය ගණනය කිරීමේදි අනිවාර්යය සේවා කාලය වර්ෂ 04 මාස 05 ක් අඩුවෙන් හඳුනාගෙන ගිවිසුම් ගතව තිබුණි. එම නිලධාරිනිය අනිවාර්යය සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් තොරව වැටුප් රහිත නිවාඩු මත නැවත විදේශ ගත වි තිබු අතර ආපසු සේවයට වාර්තා කර නොතිබුණි. ඒ අනුව, ගිවිසුමෙහි (13) පරිච්ඡේදයේ (ආ) ජේදය ප්‍රකාරව අයකර ගත හැකිව තිබු රු.14,407,844 ක් හා රු.117,133 ක දණ්ඩන මුදල්ද අයකර ගැනීමට නොහැකි වී තිබුණි. එසේම වැටුප් රහිත විදේශ නිවාඩු අනුමත කිරීමේදී එලඹ තිබු ගිවිසුමෙහි 02(IV) වගන්තිය ප්‍රකාරව වැටුප් රහිත නිවාඩුව අවසන්ව ආපසු නොපැමිණීම මත අයකල යුතු රු.1,238,600 ක් ද අයකර ගෙන නොතිබුණි. | ඇප බැඳුම්කරය අත්සන් කර නොතිබුණද විදේශගතව සිටි කාලය සඳහා වැටුප් ගෙවා තිබු වැවින් වැටුප් සහිත නිවාඩු ලබාගත් සේ සලකා ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මෙම නිලධාරිණිය ඇප බැඳුම්කරයක් අත්සන් කර නොමැති වීමෙන් තහවුරු වන්නේ ඇය ලබාගෙන ඇත්තේ වැටුප් රහිත නිවාඩු බවය. වැටුප් රහිත විදේශ නිවාඩු ලබා ගැනීමේ දී ආයතන සංග්‍රහයේ 10 වැනි පරිශිෂ්ඨය ප්‍රකාරව ගිවිසුම්ගතව ඇත්තේ අමාත්‍යාංශ ලේකම් සමඟ වන අතර, පළාත් සහා නීති අංශය විසින් එයට අදාළ කටයුතු සිදු කරමින් පවතී. |
| (ඈ) | සබරගමුව පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහය | | | |
| (i) | මූල්‍ය රීති 54 .1.6 | පළාත් සභාවේ අමාත්‍යාංශ 02 ක සහ ආයතන 04 ක 2000 සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ සිදු වී තිබූ වාහන අනතුරු 43 කට අදාළව රු.34,323,927 ක එකතු පාඩු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කිරීම, අයකර ගැනීමට කටයුතු කිරීම හා අදාල පරිදි කපා හැරීමට කටයුතු කරනු ඇත. |
| (ii) | මූල්‍ය රීති 259.2 | පළාත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 03 කට අදාල 2020 ජුලි 31 දින වන විටත් නොපියවූ අග්‍රිම ශේෂය රු.120,782,887 ක් විය. | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ප්‍රධාන අමාත්‍යාංශයේ නොපියවූ අත්තිකාරම් හේතුවෙන් අග්‍රිම නිරවුල් කිරීමට නොහැකී වී ඇති අතර, මාර්ග අමාත්‍යාංශය |

| | | | | |
|---|---|---|---|---|
| | | | | විසින් නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ප්‍රකාරව කටයුතු කිරීමත් කරනු ලබන අතර, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන අමාත්‍යාංශය හා රේඛීය අමාත්‍යාංශය වෙත ප්‍රතිපූර්ණය කිරීම සඳහා බිල්පත් ඉදිරිපත් කර ඇත. |
| (ඉ) | 2018 ජුනි 22 දිනැති අංක 26/2018 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 14.1.8 හා 14.1.11 ඡේදය | ර/ඇඹිලිපිටිය මහා විද්‍යාලය විසින් නිර්දේශ කිරීම, අනුමත කිරීම හා සහතික කිරීමෙන් තොරව 2018 වර්ෂයේ දී ගෙවීම් වවුචර් 105 කින් එකතුව රු.1,752,019 ක් හා 2019 ජනවාරි සිට ජුනි 26 දින දක්වා ගෙවීම් වවුචර් 25 කින් එකතුව රු.467,994 ක් පාසල් සංවර්ධන සමිති ගිණුමෙන් ගෙවීම් කර තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | වවුචර්වල අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කළෙමි. ඉදිරියේදී එවැනි අඩුපාඩු ඇති නොවීමට වගබලා ගන්නා ලෙස විදුහල්පති දැනුවත් කළෙමි. |

**2. ආදායම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට හා පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට අදාලව 2018 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම රු.61,478,981 ක් වූවද, සමාලෝචිත වර්ෂයේ දී ඉන් රු.4,034,560 ක් පමණක් අයකරගෙන තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනිම විධිමත් ක්‍රමවේදයකට අනුව සිදුකළ යුතුය. | හිඟ බදු අයකර ගැනීමට අඛණ්ඩව කටයුතු කරනු ලබන අතර, නඩු පැවරීම සිදුකර ඇත. |
| (ආ) | ඇලපාත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ දිගාන ග්‍රාම නිලධාරි වසමේ වටවල මුකලාන නැමති ඉඩමේ කුඩා ජල විදුලි බලාගාරයක් ඉදිකිරීම වෙනුවෙන් පෞද්ගලික සමාගමක් වෙත 1999 වර්ෂයේදි වසර 21 ක් සඳහා දීර්ඝ කාලීන බදු ලබා දී තිබු හෙක්ටයාර් 2.350 ක ඉඩම් කොටස වෙනුවෙන් 2020 වර්ෂය දක්වා අයකල යුතු ජල බදු රු.2,336,675 ක් අයකරගෙන නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය. | හිඟ මුදල ගෙවන ලෙසට අදාල සමාගමට දන්වා ඇති අතර, 2020 නොවැම්බර් මාසයට පෙර ගෙවා අවසන් කරන බව ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම් දී ඇත. |

**3. මූල්‍ය සමාලෝචනය**

**මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.550,406,792 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,575,207,635 ක් විය.

**4. ප්‍රඥප්ති ගිණුම්, අරමුදල් ගිණුම් හා වාණිජ අත්තිකාරම් ගිණුම්**

**4.1 ප්‍රඥප්ති ගිණුම්/අරමුදල් ගිණුම්**

**(අ) මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | අධිකාරිය භුක්ති විදිමින් පවතින කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 7ක් තුළ පවත්නා අක්කර 4.094 ක් වූ ඉඩම් සහ ඒවායේ ඉදිකර ඇති ගොඩනැගිලි අදාල පාර්ශවයන්ගෙන් පවරාගෙන තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩම් සහ ගොඩනැගිලි පවරාගෙන ගිණුම්ගත කිරීම කළ යුතුය. | අයිතිය පවරා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණ ද පවරා ගැනිමේ කටයුතු ප්‍රමාද වී ඇත. |
| (ii) | කෑගල්ල බස් නැවතුම්පලෙහි පවතින අධිකාරිය සතු කඩ කාමර 05 ක් 2017 නොවැම්බර් 01 දින සිට බදුදී තිබුණද, 2020 පෙබරවාරි 28 දින වනවිටත් රු.650,000 ක් වූ බදු මුදල් අයවී නොතිබුණි. එසේ වුවද, බදු ගිවිසුමෙහි 29 වගන්තිය ප්‍රකාරව බදු ගිවිසුම අවලංගු කර නොතිබුණි. | ආදායම් අප්‍රමාදීව අයකර ගැනීමට කටයුතු කල යුතු අතර, එසේ නොමැති අවස්ථාවලදී ගිවිසුම් ප්‍රකාරව කටයුතු කල යුතුය. | නිරීක්ෂණවලට එකඟ වේ. |
| (iii) | අධිකාරිය විසින් 2015 දෙසැම්බර් මාසයේ දී රු.3,441,110 ක් වැයකර මිලදී ගෙන තිබුණු ආරක්ෂිත කැමරා පද්ධතිය 2017 වර්ෂයේ දී අක්‍රිය වී තිබු අතර, 2020 පෙබරවාරි වන විටත් අදාල අළුත්වැඩියා කටයුතු සිදුකර නොතිබුණි. | අදාල අළුත්වැඩියා කටයුතු සිදුකර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. | අධිකාරිය සතුව තාක්ෂණික දැනුම සහිත නිලධාරියෙකු නොමැතිවීම හේතුවෙන් ක්‍රියාවිරහිත තත්ත්වයට පත් වී ඇති අතර, අළුත්වැඩියා කිරීමට උපදෙස් ලබා දී ඇත. |

## (ආ) සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අධිකාරිය විසින් අදාල සේවාවන් ඉටු කර ගැනීම සඳහා සිදු කරන ලද ඉල්ලීම් ලිපි නොමැති වීම මත ණයගැතියන් විසින් ගෙවීම් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ දී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත රු. 911,842 ක් වූ ණය ගැති ශේෂයක් බොල් ණය ලෙස කපා හැර තිබුණි. | අදාල සේවාවන් ඉටු කළ බවට අධිකාරිය සතුව පවත්නා ලේඛන පරික්ෂා කොට ණයගැති ශේෂය අයකිරීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |

## (ඇ) පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සබරගමුව පළාත තුළ පිහිටුවා ඇති සහ පවත්වාගෙන යනු ලබන සියළු පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම අධිකාරියේ ප්‍රධාන කාර්යභාරය වුවත් 2019 වසර වන විටත් ලියාපදිංචිකර නොමැති පෙර පාසැල් 275 ක් පැවතුණි. තවද 2019 වර්ෂය සඳහා වාර්ෂික ලියාපදිංචිය යාවත්කාලීන නොකළ පෙර පාසැල් සංඛ්‍යාව 824 ක් වූ අතර එය මුළු ලියාපදිංචි සංඛ්‍යාව වූ 1,238 න් සියයට 67 ක් විය. | සියළුම පෙර පාසල් ලියාපදිංචි කිරීමට කටයුතු කල යුතුයි. | මේ වන විට සබරගමුව පළාත තුළ ලියාපදිංචි කර ඇති සමස්ථ පෙර පාසැල් 1269 න් පෙර පාසැල් 10 ක් දැනට වසා ඇති අතර වාර්ෂික ලියාපදිංචිය යාවත්කාලීන නොකළ පෙර පාසැල් 824 න් 571 ක් ලියාපදිංචිය යාවත්කාලීන කර ඇත. ලියාපදිංචිය සඳහා අයදුම් පත්‍ර යොමු කළ පෙර පාසැල් 100 ක් ඇති බවද හදුනාගෙන ඇත. |

## (ඈ) පින්නවල ඉපැරණිගම තේමා උද්‍යානය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2014 දෙසැම්බර් 30 දිනැති අංක 03/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03(vii) ඡේදය ප්‍රකාරව නිලධාරියෙකුගේ ස්ථිර තනතුරට අමතරව වෙනත් තනතුරක වැඩබැලීමට හෝ රාජකාරි ආවරණය කිරීමට පත් කර ඇති විටක | චක්‍රලේඛය ප්‍රකාරව ගෙවීම් කළ යුතු අතර, වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළයුතුය. | අදහස් දක්වා නොමැත. |

චක්‍රලේඛයේ 2(iii)(ආ) යටතේ හිමිවන දුරකථන දීමනාව ලෙස ගෙවිය හැක්කේ එක් තනතුරක් සඳහා අදාලවන මාසික උපරිම ඒකාබද්ධ වියදම් සීමාව යටතේ වුවද, ඊට පටහැනිව 2017 සිට 2019 ජුනි දක්වා සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි සඳහා දුරකථන දීමනා පිළිවෙලින් රු.87,500 ක් හා රු.100,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**(ඉ) නිවාස සංවර්ධන අරමුදල**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1993 අංක 05 දරන සබරගමුව පළාතේ නිවාස සංවර්ධන අරමුදල පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තියේ 03 වගන්තිය ප්‍රකාරව 2017 වර්ෂයේ සිට අරමුදලට මුදල් බැරකර නොතිබීම හේතුවෙන් අරමුදලේ අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. | ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2017 වර්ෂයේ සිට පළාත් සභා ප්‍රදාන ලැබී නොමැති අතර, ඉදිරියේ දී අරමුදලට මුදල් ලබා ගැනීමට ක්‍රමවේදයක් සකස් කරමි. |

**(ඊ) සමාජ සේවා අරමුදල**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1994 අංක 04 දරන සමාජ සේවා අරමුදල පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තියේ අරමුදලට මුදල් රැස්කිරීම, අරමුදල් යෙදවීම හා පරිපාලනය කිරීමේ රෙගුලාසි 24 ප්‍රකාරව වෙනත් කිසිදු ආධාර යෝජනා ක්‍රමයකින් ආධාර හෝ සහනාධාර ලැබී නැති ඉතාමත් අන්ත දුගී තත්ත්වයෙන් සිටින පවුල්වල පුද්ගලයින්ට සහනයක් සැපයිය හැකි බව දක්වා තිබුණි. එහෙත් එවැනි පවුල් පිළිබඳව ප්‍රමාණවත් සමීක්ෂණයක් සිදු කර ඔවුන් හඳුනාගෙන ආධාර ලබා දීමට | අරමුදල ප්‍රශස්ථ ලෙස උපයෝජනය කිරිමට කටයුතු කළ යුතුය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සමාජසේවා නිලධාරින් හා සංවර්ධන නිලධාරින් විසින් හඳුනාගන්නා ලද පවුල් සඳහා ආධාර ලබා දී ඇත. |

| | | |
|---|---|---|
| ප්‍රමාණවත් පරිදි කටයුතු නොකිරීම නිසා ද්‍රව්‍ය හා මුදල් ආධාර වෙනුවෙන් 2018 වර්ෂයේ දී දැරූ රු.18,669,207 ක වියදම 2019 වර්ෂයේදී රු.9,801,742 ක් දක්වා පහත වැටී තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය අවසානයට අරමුදලේ රු.79,133,415 ක ශේෂයක් පැවතුණි. | | |

**4.2 වාණිජ අත්තිකාරම් ගිණුම්**

**(අ) උඩුගොඩ - සත්ත්ව පාලන සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කෑගල්ල දිස්ත්‍රික්කය තුළ වසර මුළුල්ලේම වගාවන් සහ සත්ව පාලන කටයුතුවල නිරත විය හැකි දේශගුණ තත්වයක් පවතින නමුත් , ගොවිපල සතුව පවතින අක්කර 100 ක පමණ භූමි ප්‍රමාණයෙන් සියයට 50ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ගොවිපල සතු යන්ත්‍ර හා උපකරණ උපරිම ධාරිතාවයකින් යුතුව නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගොවිපල භූමිය හා භෞතික සම්පත් ප්‍රශස්ථ ලෙස උපයෝජනය කළයුතුය. | ගොවිපල නිෂ්පාදන සඳහා පවතින වෙළඳපල පුළුල් කර ගනිමින් අවශ්‍ය ප්‍රතිපාදන ලබාගෙන ගොවිපල පුළුල් කිරීමට කටයුතු කරමි. |

**(ආ) මෙනේරිපිටිය- අටළුගම අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මෙනේරිපිටිය අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානයේ 2019 මැයි සිට ඔක්තෝබර් දක්වා වූ කාල සීමාව තුළ කුවිතාන්සි 31 කින් රු. 3,266,764 ක් වූ මුදල් භාර ගැනිමේ දී සබරගමුව පළාතේ පළාත් මූල්‍ය රීති 113.3.1 ට පටහැනි ලෙස කුවිතාන්සිවල මුල් පිටපත මුදල් ගෙවනු ලබන්නාට නිකුත් නොකර ආයතනය තුළ රඳවා ගෙන තිබුණි. | ආදායම ලැබෙන අවස්ථාවේදීම කුවිතාන්සි නිකුත් කල යුතුය. | ලැබෙන ආදායම් සඳහා කුවිතාන්සි නියමිත වේලාවේ දී නිකුත් කර අදාළ ආයතන වලට යැවීම ප්‍රමාද වී ඇත. ඉදිරියේ දී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට අදාළ මධ්‍යස්ථාන භාර නිලධාරීවරයාට උපදෙස් ලබා දී ඇත. |

## 5. මෙහෙයුම් සමාලෝචනය

## 5.1 කාර්ය සාධනය

### 5.1.1 රජයේ ප්‍රදාන

පළාත් සභා සංවර්ධන වැඩ යෝජනා සඳහා ලැබී තිබූ ප්‍රතිපාදනයන් සහ උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | මූලාශ්‍රය | පළාත් සභාව වෙත ලැබුණු මුදල | වැයකළ මුදල | ඌණ උපයෝජනය |
|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| (අ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) | 1,293 | 1,404 | |
| (ආ) | පළාත් සංවර්ධන ප්‍රදාන (PDG) | 276 | * | 11 |
| (ඇ) | උපමාන පාදක ප්‍රදාන (CBG) | 240 | 394 | |
| (ඈ) | විශේෂ අංශ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන (සෞඛ්‍ය) | 185 | 169 | 16 |
| | | 1,994 | 1,967 | 27 |

* පළාත් සංවර්ධන ප්‍රදානවලට (PDG) අදාල වියදම (PSDG) හා (CBG) වියදම් තුළ ඇතුළත් වේ.

### 5.1.2 පළාත් සංවර්ධන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ සංවර්ධන සැලැස්මෙහි ඇතුළත් වැඩසටහන් 08 ක් සඳහා එකතුව රු.6,255,510 ක් අනුඥාත කර තිබුණද , 2019 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තාව අනුව ඉන් රු.3,040,889 ක් ඉතිරි වී තිබූ අතර, එය එම වැඩසටහන්වලට වෙන් කළ මුදලින් සියයට 19 සිට සියයට 100 දක්වා වූ පරාසයක් ගෙන තිබුණි. තවද, වර්ෂය අවසානවීමට ඉතා ආසන්න කාලසීමාවන් තුළ දී වැඩසටහන් අනුඥාත කර තිබීම මෙම තත්ත්වයට හේතු වී තිබුණි. | සැලසුම් කරනලද වැඩසටහන් උපරිම වශයෙන් ක්‍රියාත්මක කරවීමට පියවර ගත යුතුය. | සමාලෝචිත වර්ෂයේ සංවර්ධන සැලැස්ම 2019 ජුනි මස අනුමත වී ඇති බැවින් මෙම තත්ත්වය ඇති වී ඇත. |

**5.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රඹුක්කන විධායක ඉංජිනේරු කාර්යාලය පිහිටි හෙක්ටයාර් 1.9263 ක වපසරියකින් යුක්ත ඉඩමෙන් හෙක්ටයාර් 0.6867ක් වන බිම් කොටස් 11 ක් අනවසර පදිංචිකරුවන් විසින් අත්කරගෙන තිබුණි. රජයේ වැඩ දෙපාර්තමේන්තුව සතුව තිබූ මෙම ඉඩම 1987 වර්ෂයේදි මාර්ග සංවර්ධන අධිකාරියටත්, ඉන් අනතුරුව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය වෙතත් අවිධිමත්ව භාරදී තිබුණු අතර පවරා ගැනීම් කටයුතු මේ දක්වා සිදුව නොතිබුණි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය යටතේ පවතින ආයතන පවත්වාගෙන යන ඉඩම්, පළාත් සභාව වෙත පවරාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. | මෙම ඉඩම සම්බන්ධයෙන් ගත හැකි උපරිම ක්‍රියා මාර්ග මේ වන විට ගෙන ඇත. |
| (ආ) | පළාත තුළ නව ආදායම් මාර්ග හඳුනාගැනීමට හා ආදායම් මාර්ග වැඩි දියුණු කර ගැනීමේ අරමුණින් පළාතේ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ගාස්තු මුදල සංශෝධනය කිරීමට 2015 වර්ෂයේ දී තීරණය කර තිබුණද වසර 30 කට ආසන්න කාලයක් පැරණි ගාස්තු ක්‍රමය ක්‍රියාත්මක වී තිබුණි. | රජයට උපරිම වාසියක් සැලසෙන පරිදි කාලීනව ගාස්තු සංශෝධනය කල යුතුය. | සබරගමු පළාත් සභාවේ නිල කාලය අවසන්ව තිබීම තුළ නව පළාත් සභාවක් තේරී පත්වන තෙක් ප්‍රඥප්ති සංශෝධනයක් කළ නොහැකි බැවින් එතෙක් ගාස්තු සංශෝධනය කිරීම සඳහා ද අවස්ථාවක් නොලැබේ. |
| (ඇ) | ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 1995 වර්ෂයේ සිට අනවසරයෙන් භුක්ති විඳිනු ලබන රජයේ ඉඩම් හෙක්ටයාර 9.9123 ක් දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබා දීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා සහ අමාත්‍යවරයා විසින් පිළිවෙලින් 2011 සහ 2016 වර්ෂයන්හි දී අනුමත කර තිබුණි. 2020 ජනවාරි 13 දින වන විටත් අදාළ ඉඩම් භුක්ති විඳින පුද්ගලයින් 04 දෙනෙකුගෙන් | කඩිනමින් බදුකරුවන් ලබා දී හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | බදු මුදල සම්බන්ධයෙන් බදුකරුවන්ගේ ඉල්ලීම් සඳහා අනුමැතිය ලැබී ඇති අතර, ඒ අනුව ඉදිරි කටයුතු සිදුකරනු ඇත. |

| | | | |
|---|---|---|---|
| | අයකළ යුතු රු.10,451,432 ක හිඟ බදු මුදල් අයකර දීර්ඝ කාලීන බදුකරයන් ලබා දීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරින් විසින් සමිතියක නිලවරණ කටයුතු වෙනුවෙන් සහභාගි වූ බව දක්වමින් රු.409,000 ක දීමනා අදාල සමිතියෙන් සාවද්‍ය ලෙස ලබාගෙන තිබූ බව පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් අනාවරණය කරගෙන තිබුණු නමුත්, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සාවද්‍ය දීමනා ලබාගත් සියළු නිලධාරින් හඳුනාගෙන අයකිරීම් සිදුකළ යුතු ය. | සාවද්‍ය ගෙවීම් සම්බන්ධයෙන් වාර්තාවේ සඳහන් නිලධාරීන්ගෙන් අයකරන ලෙස සහකාර කොමසාරිස් දැනුවත් කර ඇත. |

**5.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

----------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යයන් වශයෙන් සමුපකාර සමිති සංවර්ධනය කිරිම, සමුපකාර සමිති පාලනය කිරිම හා සමිතිවලට උපදේශාත්මක සේවාවන් සැපයීම හඳුනාගෙන තිබුණ ද, සබරගමුව පළාත තුළ පවතින සමුපකාර සමිති 687 ක් විසින් අවසන් වරට ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමිති 156 ක රු.91,591,250 ක එකතු මූල්‍ය අලාභයක් පැවතුණි. | සමිතිවල මූල්‍ය පාලනය සම්බන්ධයෙන් අධීක්ෂණ කටයුතු වඩා විධිමත් කළ යුතුය. | වරින් වර සමිතිවල පරිපාලනය හා මූල්‍ය කටයුතු සම්බන්ධව චක්‍රලේඛ මඟින් උපදෙස් ලබා දී ඇති අතර, ඉදිරියේ දී ද අදාල උපදෙස් ලබා දීමට කටයුතු කරමි. |
| (ආ) | සමුපකාර සංවර්ධන අරමුදල මඟින් 1997 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා කාලසීමාව තුළ දී සමුපකාර සමිති 07 ක් වෙත ලබා දී තිබූ ණය මුදලින් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය හා පොළිය පිළිවෙලින් රු.4,456,444 ක් හා රු.6,536,961 ක් වූ අතර, එම ණය අය කර ගැනිමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ ණය හා පොලිය අයකරගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු ය. | සමුපකාර සමිති ඈවර කිරීමට පියවර ගැනීම, වාරික අයකිරීමට එකඟතාවය ලබා ගැනීම ආදී පියවරයන් ගෙන ඇති අතර, අක්‍රීය සමිති පැවතීම සහ තොරතුරු සොයාගත නොහැකිවීම මෙම තත්ත්වයට හේතු වී ඇත. |

**5.4** **මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2014 නොවැම්බර් 28 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ 03/2012(1) චක්‍රලේඛය මඟින් පළාත් පාලන ආයතනවල නගරාධිපතිවරුන් හා සභාපතිවරුන් වෙත රු.5,000 ක සීමාවකට යටත්ව මාසික ඉන්ධන දීමනාවක් ලබාදීම අනුමත කර තිබුණි. පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත එක් එක් සභාව විසින් අනුමත ඉන්ධන ලීටර් ප්‍රමාණයක් මාසිකව ලබාදෙමින් පැවතියදී මාසික ඉන්ධන දීමනාවක් ද අනුමත කර තිබුණි. | පළාත් පාලන ආයතනවල නගරාධිපතිවරුන් හා සභාපතිවරුන් වෙත සභාව විසින් අනුමත ඉන්ධන ප්‍රමාණයක් මාසිකව සපයන බැවින් ඊට අමතරව ඉන්ධන දීමනාවක්ද ගෙවීම විධිමත් නොවේ. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184(ඊ) යටතේ ප්‍රාදේශීය සභාවක සභාපතිවරයාට සහ සභිකයින්ට ගෙවිය යුතු දීමනා සම්බන්ධව විෂයයභාර අමාත්‍යවරයාට බලය ලබාදී ඇති අතර, එම බලතල ප්‍රකාරව අදාල ඉන්ධන දීමනාව ගෙවීම අමාත්‍යවරයා විසින් අනුමත කර ඇත. |
| (ආ) | අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය සබරගමුව පළාත තුළ ක්‍රියාත්මක කිරිම සඳහා යොදවන නිලධාරීන්ට දීමනා ගෙවීමේ දී සබරගමුව පළාත් ආණ්ඩුකාරවරගේ අංක 7/3/9/11 හා 2016 සැප්තැම්බර් 07 දිනැති ලිපිය ප්‍රකාරව විධායක නිලධාරින් සඳහා මූලික වැටුපට විශේෂ දීමනාවද එකතු කර ඉන් 1/3 ක දීමනාවක් වශයෙන් ගෙවීම් කර තිබීම හේතුවෙන් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහ කලාප අධ්‍යාපන කාර්යාලවල නිලධාරින් වෙනුවෙන් 2016 - 2018 දක්වා කාලපරිච්ඡේදය තුළ රු.336,666 ක් වැඩිපුර ගෙවා තිබුණි. | දීමනා ගෙවීමේදී මූලික වැටුප පදනම් කරගෙන ගෙවීම් සිදු කල යුතුය. | ආණ්ඩුකාරවර අනුමැතිය පරිදි ගෙවා ඇත. |

## 5.5 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් සඳහා වන අත්පොතෙහි තුන්වන පරිච්ඡේදයෙහි 5.5 වගන්තිය ප්‍රකාරව ආහාර පරිහරණය කරන C හා D ලෙස වර්ග කර ඇති ආයතන මසකට වරක් ද, B ලෙස වර්ග කර ඇති ආයතන මාස දෙකකට වරක් ද, A ලෙස වර්ග කර ඇති ආයතන මාස තුනකට වරක් ද පරීක්ෂා කළ යුතු බව දක්වා තිබුණ ද, පැල්මඩුල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශ 03 ක ආහාර පරිහරණය කරන ආයතන 374 ක් සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි පරීක්ෂාවේ දී එම සියළු ආයතන 2017, 2018 හා 2019 වර්ෂවලදි එපරිදි පරීක්ෂා කර නොතිබුණි. | සියළු ආහාර පරිහරණය කරන ආයතන පරීක්ෂාවට භාජනය කෙරෙන පරිදි වැඩසටහන් සැලසුම් කළ යුතු අතර, ඒ පිළිබඳ නිසි අධීක්ෂණයක් සිදුකළ යුතුය. | නිලධාරී ස්ථාන මාරුවීම, ඩෙංගු වසංගතයට මූලිකත්වය දීම, වසා ඇති ආයතන පිළිබඳ තොරතුරු යාවත්කාලීන කර නොතිබීම මෙම තත්වයට හේතු වී ඇති අතර, එම ගැටළුකාරී තත්ත්වයන් නිරාකරණය කර ඉදිරි පරීක්ෂණ කටයුතු විධිමත් කිරීමට කටයුතු යොදා ඇත. |

## 5.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වැඩ වටිනාකම රු.120,710,188 ක් වූ පුස්සැල්ල පුහුණු මධ්‍යස්ථානයේ පස්මහල් නව නේවාසිකාගාරය ඉදිකිරීමේ කර්මාන්තයට අදාලව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය- 2006 හි 5.4.8(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව රු.6,035,509 ක කාර්යය සාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණු අතර, 5.4.4.(i) මාර්ගෝපදේශයට පටහැනි ලෙස කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 35 ක් වූ රු.42,248,566 ක් අත්තිකාරම් ලෙස ගෙවීම් කිරීම හේතුවෙන් රු.18,106,528 ක් වැඩිපුර ගෙවා තිබුණි. 2020 ඔක්තෝබර් 19 දින වන විට ගෙවා තිබු අතුරු බිල්පත් වලින් රු.17,546,238 ක් අත්තිකාරම් | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කොන්ත්‍රාත් කටයුතු සිදු කල යුතුය. | අධිකාරිය සබරගමුව පළාත් සභාවට අයත් ආයතනයක් බැවින් මෙම ආයතනය වෙත ඉදිකිරීම් කර්මාන්තවලට අදාළ කොන්ත්‍රාත් පිරිනැමීමේදි කාර්ය සාධන ඇපකර ලබාගැනීම ආරම්භයේ සිටම සිදු කර නොමැත. එවකට සිටි ප්‍රධාන ලේකම්ගේ අනුමැතියට යටත්ව රු.42,248,566 ක අත්තිකාරම් මුදලක් ලබාදීමට කටයුතු කර ඇත. අයකරගතයුතු අත්තිකාරම් මුදල වහාම ආපසු ගෙවන මෙන් අධිකාරිය වෙත අවස්ථා කිහිපයකදී දැනුම් දී ඇති අතර එම ආයතනයට ගෙවීමට ඇති වෙනත් කර්මාන්තවල බිල්පත් හා රැඳවුම් මුදල්වලින් මෙම අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කරමින් පවතී. |

| | | |
|---|---|---|
| ලෙස අයකරගෙන තිබූ අතර, තවදුරටත් රු.24,702,328 ක් අයවිය යුතුව පැවතුණි.<br>තවද, 2020 ජුනි 24 දිනවන විට ද ඉදිකිරීම් නිම කර නොතිබුණු අතර කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා දමා තිබුණි. | | මෙම ගොඩනැඟිල්ලේ ඉතිරි වැඩ සඳහා ඇස්තමේන්තුවක් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) වෙතින් කැඳවා ඇත. දැනට සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත ඉදිකිරීම් කර්මාන්තවලට අදාළ කොන්ත්‍රාත් පිරිනැමීම අත්හිටුවා ඇත. |

**5.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සබරගමුව පළාතේ සංචාරක ප්‍රවර්ධනය අරමුණු කරගනිමින් පළාත් මාර්ග අමාත්‍යාංශය විසින් 2014 සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ දී රු.2,030,475 ක් වැය කරමින් සීලෝගම ප්‍රජා සංචාරක ගම්මානයේ සංචාරක නිවාස සඳහා උපකරණ ලබා දීම හා ගොඩනැගිලි ඉදිකිරීම සිදුකර තිබුණ ද අදාල අරමුණ වෙනුවෙන් එම උපකරණ/ගොඩනැගිලි උපයෝජනය කර නොතිබුණි. | අපේක්ෂිත අරමුණු ලබා කරගැනීම පිළිබඳව නිසි අධීක්ෂණයක් සිදු කළ යුතුය. | ලබා දී තිබූ උපකරණ අපේක්ෂිත අරමුණු වෙනුවෙන් භාවිතා කිරීමට අදාල ආයතන විසින් කැමැත්ත පලකර ඇත. |

**5.8 කාර්ය මණ්ඩල පරිපාලනය**

**5.8.1 අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රය හැර පළාත් සභාවේ අනෙකුත් ආයතනවල කාර්ය මණ්ඩල ඌණතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහකාර ලේකම් (විභාග) තනතුර කොමිෂන් සභාව පිහිට වූ දින සිට සහ සහකාර ලේකම් (පාලන) තනතුර 2001 වර්ෂයේ සිටද පුරප්පාඩුව පැවතුණු අතර, ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 03 න් 02 ක්ම දීර්ඝ කාලයක සිට පුරප්පාඩු වී පැවැතුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කිරීම සිදු කළ යුතුය. | සහකාර ලේකම් තනතුරු පුරප්පාඩු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුර 2012 වර්ෂයේ සිටද සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණික) තනතුර 2016 වර්ෂයේ සිටද පුරප්පාඩු වී පැවතුණි. | පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කළ යුතුය. | හැකි ඉක්මනින් අදාළ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ඉඩම් අමාත්‍යාංශයේ සහකාර ලේකම් තනතුරු 02 න් එක් තනතුරක් අමාත්‍යාංශය පිහිටවූ දින සිට පුරප්පාඩුව පැවති අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම තනතුර ද ඇතුළුව පුරප්පාඩු 07 ක් පැවතුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. | බඳවා ගැනීම් සිදුකිරීමට අවශ්‍ය වුවද අමාත්‍යාංශයේ ඉඩ පහසුකම් නොමැති බැවින් පුරප්පාඩු සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇත. |
| (ඈ) | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේ කාර්මික නිලධාරි විශේෂ ශ්‍රේණියේ තනතුරු 12 ක්, සැලසුම් ශිල්පී විශේෂ ශ්‍රේණියේ තනතුරු 03 කට අයත් 15 ක්, කාර්මික නිලධාරි (I/II/III) 29 ක්, සංවර්ධන නිලධාරි 16 ක්, කළමනාකරණ සහකාර තනතුරු 02 ක්, කාර්මික සහායක තනතුරු 09 ක් හා සැලසුම් ශිල්පි (I/II/III) එකක් ඇතුළුව ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 57 ක් සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 12 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පැවැතුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගැනිමේ කටයුතු සිදුකරමින් පවතී. |
| (ඉ) | පළාත් පාලන ආයතන 13 ක ලේකම් තනතුරු 2002 සිට 2016 දක්වා වූ කාලපරිච්ඡේදයේ සිට පුරප්පාඩු වී තිබුණු අතර, ප්‍රාදේශීය සභා 02 ක ලේකම් තනතුරු 2018 වර්ෂයේ සිට පුරප්පාඩු වී තිබුණි. අදාල තනතුරු සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරීන් අනුයුක්ත කරමින් පැවති නමුත් ඒ සඳහා ස්ථිර නිලධාරීන් පත්කිරීමට කටයුතු කර නොතිබුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. | පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව දැනුවත් කර ඇත. |

**5.8.2 අධ්‍යාපන ක්ෂේත්‍රයේ කාර්ය මණ්ඩල පුරප්පාඩු හා අතිරික්ත**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කෑගල්ල, ගලිගමුව, දැදිගම හා වරකාපොල යන අධ්‍යාපන කොට්ඨාශවල පාසල් 11 ක ගුරු පුරප්පාඩු 40 ක් පැවතුණි. තවත් පාසල් 44 ක ගුරු අතිරික්තතා පිළිවෙලින් 167 ක්, 62 ක් , 08 ක් හා 28 ක් විය. අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2016 ජනවාරි 07 දිනැති අංක ED/03/38/03/13 දරන චක්‍රලේඛයේ 8.2 ඡේදය ප්‍රකාරව ගුරු ඌනතා හා අතිරික්තතා ගණනය කර ගුරු මාරු ප්‍රතිපත්තිය ද සැලකිල්ලට ගනිමින් කලාපය තුළ ගුරු තුළනය සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ගුරු ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කල යුතුය. | ප්‍රායෝගිකව ගුරු අතිරික්තයක් නොපවතින අතර වාර්ෂිකව ස්ථාන මාරුවීම් වලදී අතිරික්ත ගුරුභවතුන් ඌනතා පවතින පාසල් වෙත ස්ථාන මාරු කිරීමට පියවර ගෙන ඇත. විගණන විමසුමෙන් පෙන්වා දීමෙන් පසු අතිරික්ත ගුරුභවතුන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට ලිපි යවා ඇත. |

**5.8.3 සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කාර්ය මණ්ඩල අතිරික්තතා හා ඌනතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විට වෛද්‍ය නිළධාරින් 230 දෙනෙක්, හෙද නිලධාරිණි 334 දෙනෙක්, හෙද සොයුරියන් 29 දෙනෙක්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින් 251 දෙනෙක් හා උපස්ථායකවරුන් 165 දෙනෙක් වශයෙන් පුරප්පාඩු පැවති අතර, එය පළාතේ සෞඛ්‍ය සේවාවේ කාර්ය සාධනයට අහිතකර ලෙස බලපෑ හැකිව තිබුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළ යුතුය. | සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තනතුරු සඳහා බඳවාගැනීම රේඛීය අමාත්‍යාංශයෙන් සිදුකරනු ලැබේ. |
| (ආ) | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ නිලධාරින් 190 ක පුරප්පාඩු පැවති අතර, නියෝජ්‍ය පළාත් ආයුර්වේද කොමසාරිස්වරයෙකු, විශේෂඥ ආයුර්වේද වෛද්‍ය නිලධාරින් 11 දෙනෙකු, ආයුර්වේද වෛද්‍ය අධිකාරිවරයෙකු, කාර්යභාර ආයුර්වේද වෛද්‍ය නිලධාරියෙකු, අධීක්ෂණ ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියෙකු,හෙද නිලධාරින් 07 දෙනෙකු වෛද්‍ය රසායනාගාර ශිල්පීන් දෙදෙනෙකු, සම්භාහකවරුන් 34 දෙනෙකු, | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළ යුතුය. | පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනිම් සිදුකරන ලෙස අදාල අංශ වෙත දැනුම් දී ඇති අතර, අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇත. |

ආයුර්වේද ඖෂධවේදින් 10 දෙනෙකු, ඖෂධ සංයෝජකවරුන් 14 දෙනෙකු සහ උපස්ථායකවරුන් 41 දෙනෙකු එම පුරප්පාඩු තනතුරුවලට ඇතුළත් වී තිබුණි. තවද, ආයුර්වේද වෛද්‍ය නිලධාරින් 12 දෙනෙකු සහ සාමාන්‍ය සහ සනීපාරක්ෂක කම්කරුවන් 85 දෙනෙකුගේ අතිරික්තයක් පැවතිණි.